# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
# (CFHC)

# පුරප්පාඩු

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : යාන්ත්‍රික ඉංජිනේරු**

**තනතුරු සංඛ්‍යාව** : තනතුරු 01

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) හත් වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : **රු. 91,690 - 10 × 2,480 - 15 × 3,450 - 168,240**
(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

**වයස් සීමාව** : අවු: 22 ට **නොඅඩු** හා අවු: 45 ට **නොවැඩි** විය යුතුය.
(දැනටමත් රාජ්‍ය, සංස්ථා, දෙපාර්තමේන්තුවල සේවයේ නිරත අයට මෙය අදාළ නොවේ.)

රජයේ අනුමත සියලු දීමනා සංස්ථාව විසින් ගෙවනු ලැබේ.

අයදුම්කරු රාජ්‍ය, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු නම් එම ආයතනයේ ප්‍රධානියා මඟින් අයදුම්පත් එවිය යුතුය.

**ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම සහ ලිපිනයන් සහිතව** සම්පූර්ණ කරන ලද අයදුම්පත් **"සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, නො.15, රොක්හවුස් පටුමග, කොළඹ - 15."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළවී **දින 07 ක් ඇතුළත එවිය යුතුය.** ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.

**සභාපති,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**
**නො. 15, රොක්හවුස් පටුමග,**
**කොළඹ - 15.**

SELACINE